# පරිසරය පිළිබඳ ආදි බුදුසමයේ පැනෙන විවරණයෙහි අන්තර්ගත සදාචාරාත්මක උපයෝගිතාව; විමර්ශනාත්මක අධ්‍යයනයක්

සම්පත් සුරංග ජයසිංහ

## Abstract

This study examines the ethical principles within Buddhism regarding environmental stewardship, originating from the teachings of Siddhartha Gautama (the Buddha) in 6th century BCE India. The research explores how Buddhist doctrine underscores the interdependence between humans and their environment, advocating for a profound sense of responsibility toward ecological preservation. The Buddha's teachings, which emphasized the intrinsic value of nature, illustrate an inherent obligation to protect and nurture the environment. Historically, Buddhist communities maintained a harmonious relationship with their surroundings, yet contemporary practices characterized by excessive consumption and industrialization have led to significant environmental degradation. By advocating for simplicity and contentment, Buddhist ethics offer valuable insights into sustainable living. This study aims to integrate these ancient principles with modern conservation efforts, emphasizing the relevance of Buddhist ecological ethics in fostering a sustainable interaction with the environment and addressing contemporary environmental challenges.

**Keywords:** Buddhist Ethics, Environmental Stewardship, Ecological Preservation Sustainable Living, Interdependence

## හැඳින්වීම

ක්‍රිස්තු පූර්ව 6 වැනි සියවසේ, භාරතයේ වාසය කළ සිද්ධාර්ථ ගෞතම බුදුන් වහන්සේ විසින් දේශනා කළ ධර්මයෙහි ආචාර ධර්ම මූල ධර්ම මුල් බැස ගෙන ඇත. අප මෙහි දී විශේෂයෙන් අවධානය යොමු කරන්නේ පරිසරය පිළිබඳ බෞද්ධ සදාචාර ධර්ම පිළිබඳ අධ්‍යයනය කිරීමටය. මිනිසා සහ පරිසරය අතර ඇත්තේ අවියෝජනීය බැඳීමකි. සමස්ත මානව වර්ගයාගේ සහ සියලු ජීවින්ගේ නිවහන පෘථිවිය වේ. එහෙයින් පෘථිවියේ උරුමය මානව ප්‍රජාවට මෙන්ම සියලු සත්වයන්ට ද උරුමය. පෘථිවියේ සුන්දරත්වය මෙන් ම එහි ජීව ගුණය පවතින්නේ සමස්ත පරිසර පද්ධතිය අනුසාරයෙනි. සමස්තයක් වශයෙන් ගත් කළ අප ජීවත් වන පෘථිවිය එක් පරිසර පද්ධතියකි. එමෙන් ම මහද්වීප, දූපත් හා ඇතැම් විශේෂිත භූ ගෝලීය වශයෙන් වෙන් කළ හැකි සීමාවන්ගෙන් යුක්ත ප්‍රදේශ අනු පරිසර පද්ධති වශයෙන් සැලකිය හැකිය. මෙම පරිසර පද්ධති අතර අන්තර් ක්‍රියාකාරිත්වයක් පවතී. මිනිසා ඇතුලු කිසිදු සත්ත්වයෙකුට ස්වායක්ත පැවැත්මක් පරිසරයෙන් තොරව උරුම නැත. අප ගන්නා හුස්ම පොදක් පාසා පානය කරන ජල බිඳක් පාසා පරිසරයට ණය ගැතිය. අපගේ ජීවය නිරන්තරයෙන් රැඳී ඇත්තේ පරිසරය ඇසුරේය. අපි පරිසරයට ණය ගැති වුවත් වර්තමානයේ සිදුව ඇති පාරිසරික විනාශය ට වගකිව යුතු වන්නේ ද අපමය. ඒ සම්බන්ධයෙන් අපගේ ක්‍රියාවේ අගය ප්‍රමාණයෙන් කුමක් වුවත් අප සියලු දෙනා එයට වගකිව යුත්තෝ වෙමු. පුරාණ වැසියන් පරිසරය හා ඉතා සුහදව ගණුදෙනු කළත් වර්තමානය වන විට එම තත්ත්වය බෙහෙවින් වෙනස්ව ඇත. මිනිසාගේ පැවැත්ම ඉතා සංකීර්ණ බවට පත්ව ඇති අතර ඔවුන්ගේ අසීමිත ඕනෑකම්, ආශාවන ් හේතුවෙන් පරිසරය දිනෙන් දින විපර්යාසයට ලක් වෙමින් පවතී. අප මෙහි දි සාකච්ඡා කිරීමට අදහස් කරන්නේ පරිසරය පිළිබඳ බෞද්ධ ආකල්පය කුමනාකාර ද යන්න පිළිබඳව ය. පරිසරය සමඟ මිනිසා කටයුතු කළ යුතු ආකාරය බුදුන් වහන්සේගේ දේශනා ඇසුරින් පරික්ෂා කළ හැකිය. බුදුරජාණන් වහන්සේ පරිසරය සම්බන්ධයෙන් දරණ ලද ආකල්පය ඉතා

වැදගත් ය. මානව ප්‍රජාව හා ස්වභාවික පරිසරය අතර ඇති අවියෝජනීය සම්බන්ධය බුදුදහම තුළ වඩාත් ශක්තිමත් වන ආකාරය අධ්‍යයනය කළ හැකිය. අප ජීවත් වන්නේ විවිධකාර මානව ක්‍රියාකාරකම් හේතුවෙන් නොයෙක් විපර්යාසයන්ට ලක් වන පරිසර පද්ධතියක් ඇසුරේය. තව දුරටත් මානව ප්‍රජාව පරිසරය ආරක්ෂා කර ගනිමින් පෝෂණය නොකළ හොත් නුදුරේදී ම භයානක අභියෝගයන්ට මෙන් ම අත්‍යවශ්‍ය සම්පත් ඌණතාවයකට ගොදුරු වීම නොවැළැක්විය හැකිය. මෙමගින් වර්තමාන පරිසර සංරක්ෂණ ක්‍රමවේද හා පරිසරය පිළිබඳ බෞද්ධ ආකල්ප, භාවිත අතර ඇති සමපාතභාවය සාකච්ඡා කරනු ඇත.

**පර්යේෂණ අරමුණ**

මානව ප්‍රජාව ස්වභාවික පරිසරයේ සුන්දරත්වය ආරක්ෂා කරගනිමින්, තිරසාර සංවර්ධනයක් ලගා කරගැනීමේ අපේක්ෂාව පෙරදැරිව, අධික පරිභෝජනයෙන් ඈත් ව, සරල බවේ තෘප්තිය විඳගනිමින්, ජීවත් වීමේ දී බුදුසමයෙන් පැනෙන විවරණයෙහි අන්තර්ගත සදාචාරාත්මක උපයෝගීතාව පිළිබඳ පෙන්වා දීම මෙම පර්යේෂණයේ මුඛ්‍ය පරමාර්ථය වේ.

**පර්යේෂණ ගැටලුව**

පරිසරය පිළිබඳ බෞද්ධ ආකල්පය මෙන්ම නවීන පාරිසරික උපාය මාර්ග ඒකාබද්ධ කර ගනිමින් තිරසාර පාරිසරික සංවර්ධනයක් ළගා කර ගත හැකි ද? යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ, ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රයන් භාවිතා කරමින් බෞද්ධ පාරිසරික ආචාරධර්ම හඳුනාගනිමින් නූතන පාරිසරික සංරක්ෂණ ක්‍රියාමාර්ගයන් හා තුලනය කරමින් දත්ත විශ්ලේෂණය කිරීම සිදු වේ.

## පරිසරය සම්බන්ධව බෞද්ධ ආකල්පයේ ස්වභාවය

පරිසරය යනු ස්වාභාවික ව නිර්මාණය වී ඇති ජීවී සහ අජීවී වස්තූන්ගෙන් සමන්විත අප අවට වටපිටාව යැයි සරළව නිර්වචනය කළ හැකිය. මානව ප්‍රජාවට මෙන්ම සත්වයනට ද පරිසරයෙන් තොර ස්වායත්ත ස්වාධීන පැවැත්මක් නොමැත. සියලු සතුන් මෙලොව එළිය දුටු මොහොතේ සිට ජීවත් වන්නේ පරිසරය පිහිට කොට ගෙන ය. පරිසරය උපකාර කොට ගෙන ය. මිනිසා මව් කුසින් බිහි වුවත් තව දුරටත් ජීවත් කරවනු ලබන්නේ පරිසරය විසිනි. එහෙත් මිනිසුන්ගෙන් පරිසරයට පෙරළා ලැබෙන ප්‍රති උපකාරය කුමක් ද? වර්තමාන ලෝකය දෙස බලන කළ මිනිසුන් පරිසරයට සිදු කරන හානිය ප්‍රමාණ කළ නොහැකිය. මිනිසාගේ අකාරුණික හිතුවක්කාර ක්‍රියා හේතුවෙන් පරිසරය තුළ සිදුවන විපර්යාසයන්ට නැවත ඉතා භයානක ආකාරයෙන් මුහුණ පාන්නට සිදුවන්නේ අනාගත පරම්පරාවට ය.

ජනගහණය අසීමිත ආකාරයෙන් ඉහළ යෑමත් මිනිසාගේ අවශ්‍යතා ඉතාමත් සංකීර්ණ තත්ත්වයට පත් වීමත්, මිනිසා සහ පරිසරය අතර පැවති සුහදත්වය බැඳීම දුරස්ථ වන්නට හේතු වී ඇත. කාර්මිකකරණය, පොසිල ඉන්ධන දහනය හා පාරිසරික සම්පත් අධික ලෙස පරිභෝජනය කිරීම ආදිය මගින්, දේශගුණික විපර්යාසයන්ගේ සිට ජෛව විවිධත්වය අහිමි වීම දක්වා අහිතකර ප්‍රතිවිපාක නිර්මාණය වන්නට හේතු වී ඇත. අධික පරිභෝජනය නිසා දිනෙන් දින පරිසරයට එක් වන අපද්‍රව්‍ය ප්‍රමාණය අසීමිත ය. දියුණු වෙමින් පවතින ඇතැම් රටවල අපද්‍රව්‍ය නිසියාකාරයෙන් කළමනාකරණය නොකිරීම නිසා නොදිරන ඝන අපද්‍රව්‍ය හා රසායනික අපද්‍රව්‍යයන් ද බහුල ව පරිසරයට එක් වීම සිදු වේ. අපෙක්ෂා කරන පාරිසරික තිරසාරත්වය හා තාක්ෂණික දියුණුව එකට නොපෑහීම වර්තමානයේ දැකිය හැකි ය. ජල සම්පත දූෂණය වීම වාතය අපිරිසිදු වීම වර්තමානය වන විට ඉහළ ගොස් ඇත. ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම හේතුවෙන් අහිතකර අන්දමේ දේශගුණික විපර්යාසයන්ට මුහුණ පාන්නට සිදුව ඇති අතර සාගර ජල මට්ටම ඉහළ යෑම එහි ප්‍රධානතමත ගැටලුවකි.

පරිසරය තුළ ඇති සම්පත් ජනනය වන සහ ජනනය නොවන වශයෙන් දෙයාකාර වේ. වන සම්පත ජල සම්පත ආදිය ජනනය වන සම්පත් වුවත් පොසිල ඉන්ධන, ගල් අගුරු, ආකර සම්පත් ආදිය නැවත ජනනය නොවන අතර භාවිතයත් සමඟ ක්ෂය වීමට පත් වේ. ජනනය නොවන සම්පත් වලට පවතින අධික ඉල්ලුම නිසා එම සම්පත් අත්පත් කර ගැනීමට බලවත් රටවල් ගන්නා උත්සාහය ද පරිසරය දූෂණය වීමට හේතු වී ඇත. ඉවක් බවක් නොමැති මෙම උත්සාහය හිරු එළිය, දේශගුණය, වර්ෂාව, මුහුදු රළ, භූමි කම්පා, සුනාමි, අයිස් කඳු දියවීම ආදී පරිසර සංසිද්ධීන් කෙරෙහි අහිතකර අන්දමින් බලපා ඇත. පරිසර පද්ධතිවල සමතුලිතතාවය ආරක්ෂා කර ගැනීමට ගෝලීය වශයෙන් පෙළ ගැසිය යුතු ය. විශේෂයෙන් බෞද්ධ රාජ්‍යයන් බෞද්ධ පාරිසරික ආචාර ධර්ම ක්‍රියාත්මක කරමින් ලෝකයට ආදර්ශමත් විය යුතු ය. මෙහි දී අපට, බෞද්ධ ඉගැන්වීම් මත පදනම් ව අතීත බෞද්ධ පාලකයන් හා ප්‍රජාව පරිසර සංරක්ෂණයේ නියලී සිටි ආකාරය අධ්‍යයනය කරමින්, ඒ අනුව තිරසාර පරිසර සංවර්ධනයකට මෙන්ම පාරිසරික අභියෝගයන්ට මුහුණ දීමට ඇවැසි දායකත්වය විමසා බැලිය හැකි ය.

අතීතයේ ආර්ය ජනතාව කෙවිටක් අතින් ගෙන හරකුන් එළුවන් දක්කාගෙන භාරතයට සංක්‍රමණය වන විට එහි වාසය කළ අනාර්යයන් පරිසරය හා ඒකාත්මිකව ඉතා දියුණු දිවි පෙවෙතක් ගෙවා ඇති බව මූලාශ්‍රය තුළින් ගම්‍යමාන වේ. පුරාතන යුගයේ ජනතාව පරිසරයට අවනතව, පරිසරයට කිසියම් හෝ හානියක් සිදු නොකොට පරිසරයේ කොටසක්ව වාසය කළහ. ඔවුන් ඔවුනට අවශ්‍ය සියල්ල සපයා ගත්තේ අවට පරිසරය තුළිනි. ඔවුන් පරිසරය දෙස බැලුවේ බිය මුසු ගෞරවයකිනි. එමෙන්ම අතීත මිනිසුන් පිළිසරණ පිහිට බලාපොරොත්තු වූයේ ද තමා අවට පරිසරයෙනි.

"බහුං වෙ සරණං යන්ති, පබ්බතානි වනානි ච
ආරාමරුක්ඛචෙත්‍යානි මනුස්සා භයතජ්ජිතා"
(ධම්මපදපාළි, 2020, 72 පිටුව).

අතීත මිනිසුන් විවිධාකාර කාරණා මත පදනම්ව පරිසරය හා ගණුදෙනු කළහ. ඔවුන් බියෙන් තැතිගත් විට පර්වත, මහාවන, ආරාම, වෘක්ෂ චෛත්‍යස්ථාන ආදිය සරණ ගියහ. වන්දනාමාන පුද පූජා පැවැත්වූහ. ඒවායෙන් පිහිට ආරක්ෂාව බලාපොරොත්තු විය. ඔවුන්ට පරිසරයට හානියක් කිරීමට කිසියම් හෝ අවශ්‍යතාවයක් නොවීය. ඉන්දු නිම්න ආදි වූ ශිෂ්ටාචාරයන්හි ජීවත් වූ ජනතාව ක්‍රමයෙන් දැනුමින් සන්නද්ධ විය. පරිසරය ඇසුරු කරමින් දිවි ගෙවූ මුනි නම් සුවිශේෂී කොට්ඨාශයක් මෙම ජනතාවට අවවාද අනුශාසනා දුන්හ. ඔවුන්ගේ මානසික ශක්තිය අතිමහත් විය. ඒ බවට යම් හොඩුවාවක් උපාලි සූත්‍රයේ (මජ්ඣිමනිකාය II, 2020, 69 පිටුව) ඇතුළත් වේ.

මේ අනුව  ගත් කළ බුදුන් වහන්සේ පහළ වීමට පෙර සිටම පෙරදිග ලෝකයේ ජනතාව පරිසරය සමග ඉතා සුහදශීලීව කටයුතු කර ඇත. බුදුරජාණන් වහන්සේ මහියංගනයට වැඩම කළ අවස්ථාවේ මහවැලි ගංගා තීරය අසබඩ පිහිටි මහානාග නම් ඉතා මනරම් උයනක් පිළිබඳ ව මහාවංශ ටීකාවේ විස්තර කර ඇත. ඒ අනුව,

“මහියංගන මහාසෑය පිහිටුවන ලබන තැන ගංගාතීරයෙහි, නිරන්තර සලිලධාරා වේගයෙන් හරිත වර්ණ වූ නදී තීරයෙහි රොන්මඩින් උපන් සරු බිම් පෙදෙසෙක් හි සරුවට උසට වැඩුණු ඉදු වට කඳින් හා වෙළෙපින් ද අතු පතරින් ද යුත් ලෙලෙන දලු හා සුපිපුණු මුදුනින් සරු තුරුවන ගහනින් හොබනා වූ, දුර සිට බලන්නවුන්ට පවා මරාමිණි පවු පැහැයෙන් නිල් වලා පෙළක් සෙයින් දිස්වන්නා වූ, ඇතුළට පිවිසියනට ද පිවිසි කෙණෙහි ම දාහ සන්සිඳුවීමෙහි සමත් සිහිල් සෙවණලු ඇ උයන් ගුණයෙන් යුතු වූ හෙයින් සාධු ජන හෘදය මෙන් හෘදයංගම වූ රමණීය වූ දර්ශනීය ද වූ තන්හි තන්හි රුක්මුල්හි සුපිරිසිදු මුදු සියුම් පිරිපුන් නව වැලි තලාවෙන් ගැවසී ගත් හෙයින් එහි සැපත් යොවුන් ජනයා ගේ ක්‍රීඩා විහරණයට පහසු වූ, රුක් මුලින් බැහැර තන්හි කුස තණ බිස්සෙන් සැදි පළා වන් තණ බිමින් ගැවසී ගත් බිම් පෙදෙස් ඇති,..”(වංසත්ථප්පකාසනී මහාවංස ටීකාව, 2001, 48 පිටුව).

පරිසරය සම්බන්ධයෙන් මෙතරම් මනස්කාන්ත වර්ණනාවක් කරන්නේ මනුෂ්‍යවාසයෙන් තොර යැයි සම්මත වූ අමනුෂ්‍යයන් වාසය කළ භූමියක් පිළිබඳව ය. කෙසේ නමුත් අප මෙහි දී අවධානය යොමු කරන්නේ භාග්‍යවතුන් වහන්සේ පහළ වීමටත් මත්තෙන් භාරතීය හා ලාංකේය වැසියන් පරිසරයේ අසිරිය විඳගනිමින් ඒ හා ඒකාත්මික වෙමින් ජීවත් වූ බව පෙන්වා දීමටය.

බුදුරජාණන් වහන්සේ භාරතයේ පහළ වූ සමයේ පරිසරය පද්ධතිය ඉතාමත් විධිමත් ආකාරයෙන් පැවැති බව සූත්‍ර දේශනා තුළින් ගම්‍යමාන වේ. තථාගතයන් වහන්සේගේ තෙමඟුල ද ප්‍රථම ධර්ම දේශනාව ද අවසන් දේශනාව ද ඒ අතර වාරයේ දේශනා කළ බොහෝ ධර්ම දේශනාවන් ද චමත්කාරජනක පරිසරය ඇසුරේ ම සිදු වීම විශේෂත්වයකි. බුද්ධ දේශනා ඇසුරින් තත්කාලීන ජනතාව පරිසරය සුන්දරත්වය පිළිබඳ සුවිශේෂී ඇල්මක් දක් වූ බව හෙළි වේ. එකළ භාරතීය ජනතාවගේ ලෞකික ඥානයේ ස්වභාවය, පරිසර පද්ධතියේ විධිමත් බව තුළින් මොනවට පසක් වේ. එකල භාරතයේ කුමන හෝ විමුක්තිගාමී ප්‍රතිපදාවක් වූයේ නම් එම ප්‍රතිපදා මාර්ගයේ නිරත ව සිටි ඇත්තන් පරිසරයෙහි අසිරිය ඒ සඳහා පිටුවහලක් කර ගත් බව දැකිය හැකිය. බුදුරජාණන් වහන්සේ ගණකමොග්ගල්ලාන බ්‍රාහ්මණයා හා පවත්වනු ලබන සංවාදයේ දී දේශනා කරන්නේ "රජගහනුවර ආරාමරමණීය, වනරමණීය, බිම්රමණීය, පොකුණුරමණීය" යනුවෙනි (මජ්ඣිමනිකාය 3, 2020, 95 පිටුව). බුදුරජාණන් වහන්සේ මෙම රමණීය පරිසරය, විවිධ අවස්ථාවන්හි දි වර්ණනා කර ඇති අතර පටිසෝතගාමී මාවතේ හික්මෙන සිය ශ්‍රාවකයන් හට උපකාර වන ආකාරය හා ඉන් ප්‍රයෝජන ගත යුතු ආකාරය දේශනා කර ඇත. භාග්‍යවතුන් වහන්සේ අරියපරියේසන සූත්‍රයේදී දේශනා කරන්නේ, සිද්ධාර්ථ බෝසතුන් ආලාරකාලාම හා රාමපුත්ත යන ආචාර්යන් දෙදෙනාගෙන් බැහැර ව උරුවේලාවට පැමිණ එහි පරිසරයේ සිත අළවා ගත් ආකාරයයි.

"රමණියො වන භූමිභාගො පාසාදිකො ච වනසණ්ඩො නදි ච සන්දති සෙතකා සුපතිත්ථා රමණියා, සමන්තා ච ගොචරගාමො අලං වතිදං කුලපුත්තස්ස පධානත්ථිකස්ස පධානායා ති" (මජ්ඣිම නිකාය I, 2020, 406 පිටුව)

"මහණෙනි ඒ මම කුසලය කුමක් දැයි සොයන සුලු වූයෙම් අනුත්තර උතුම් නිර්වාණපදය සොයමින් මගධ දනව්වෙහි පිළිවෙළින් සැරිසරන්නේම් උරුවේලායෙහි සේනානිගම කරා පැමිණියෙමි. එහි සිත්කලු භූමි භාගය ද, පහදවන වනළැහැබ ද, වැලිතලා ඇති මනා තොටු ඇති සිත්කලු නදිය ද ගලා බස්නී ය. හාත්පස ගොදුරුගම ද වෙයි. ප්‍රධන් කැමති කුල පුත්‍රයෙකුට ප්‍රධන්වීර්යය සඳහා මෙය සුදුසු ම ය"

ලෝකය අත් විඳින සියලු සැපෙහි දුක ම දැක, දුකින් මිදීම එකායන අරමුණ කරගෙන, ගිහි සැප හැර දමා, ආ උතුමන් පවා පරිසරය වර්ණනා කිරීම, අගය කිරීම, එහි ස්වභාව අසිරිය විඳ දරා ගැනීම, එහි ජීවත් වීම අරුමයක් නොවන්නේ ද? උක්ත සූත්‍ර අටුවාවට අනුව, මෙම රමණීය භූමි භාගය මනාව පිපුණු නෙක නෙක වර්ණයන්ගෙන් යුත්ත වූ මලින් විසිතුරු මොනර පිල් කලඹක් සේ ප්‍රසාදය ජනිත කරවන බවත් අසලින් ගලා බසින නිල් මැණිකක් සමාන වූ සුපිරිසිදු නිල් දියදහර ඇති නේරංජා නදිය ද ගලා බසින ආකාරය සිද්ධාර්ථ බෝසතුන්ගේ සිත් ගත් බවත් ඉතා පිරිසිදු මඩ රහිත පිළිවෙළින් ගැඹුරු වූ සුන්දරව පිහිටියා වූ තොටුපල ද රිදීපාටින් දිලෙන සමානව විසිරුණු වැලි තලාව මෙම භූමියේ රමණීයත්වය ඔප් නංවා ඇති බවත් දක්වා ඇත.

නිවන් මාර්ගයෙහි හික්මෙන භික්ෂූන් වහන්සේලාහට භාග්‍යවතුන් වහන්සේ අවවාද කරන ලද්දේ අරණකට හෝ රුක්මුලකට හෝ සෙනසුනකට හෝ හිස් ගෙයකට හෝ කරා ගොස් භාවනායෝගීව වීර්යය වඩන ලෙසය. උසස් කුල අතරින් අග්‍රස්ථානය ලැබූ භද්දිය හිමියන් අසූ මහා ශ්‍රාවකයන් වහන්සේලාගෙන් එක් ශ්‍රාවකයන් වහන්සේ නමක් වූ අතර

උන්වහන්සේ වනයට හෝ රුක්මුලකට හෝ ශූන්‍යාගාරයකට හෝ ගිය විට නිතර "අහෝ සුවයෙකි අහෝ සුවයෙකි" යැයි උදාන පහළ කර ඇත. උන්වහන්සේ හා එක්ව වාසය කළ අනෙක් භික්ෂූන් වහන්සේලා සිතන්නට වූයේ භද්දිය හිමියන් පෙර ගිහි කල ශාක්‍ය වංශයේ කුමාරයෙකු වූ බැවින් රජ සැප මතක්ව එසේ සිහි කරනවා ඇතැයි ය. උන්වහන්සේලා මේ බව බුදුරජාණන් වහන්සේට දැන් වූ විට බුදුන් වහන්සේ භද්දිය හිමියන් කැඳවා විමසන ලද්දේ කවර කාරණාවක් නිසා එසේ කරන්නේ දැයි ය. භද්දිය හිමියන්ගේ පිළිතුර වූයේ ගිහි සමයෙහි රාජ්‍ය කරන කල බොහෝ ආරක්ෂාව මධ්‍යයේ සිටිය ද බියෙන් සැලෙමින්, සැක ඇතිව, තැති ගැනුම් ඇතිව වාසය කළ ද වනයකට, රුක් මුලක් වෙතට, ශූන්‍යාගාරයකට ගොස් හුදකලා වුව ද කිසිදු බියකින් තැති ගැනීමකින් සැකයකින් තොරව, කිසිවක් කෙරෙහි අපේක්ෂාවක් නැති මුවාගේ සිත වැනි සිතකින් වාසය කරන බවත් ය. එහෙයින් විවේකී ස්ථානයකට ගිය විට "අහෝ සුවයෙකි අහෝ සුවයෙකි" උදන් පහළ කරන්නේ යැයි ය. මෙම පුවතින් ගම්‍යවන ගාම්භීර අර්ථය අනෙකක් වුවත් පරිසරය හා සම්බන්ධ වූ විට වීතරාගී හිත් වල පවා අධ්‍යාත්මික සුවය වචනයට නැඟූ අවස්ථාවක් වශයෙන් මෙම අවස්ථාව දැක්විය හැකිය.

රාත්‍රී කාලයේ පරිසරය තුළ ඇති නිහැඬියාව බිඳෙන්නට හිරු උදා වී හෝරාවක් දෙකක් ගත විය යුතු ය. රුක්ෂ වනස්පතීන් අතරින් ලා හිරු රැස් පොළොවට පතිත වන්නේ චමත්කාර රටා මවමිනි. මන නුවන් පිනවන මෙම මනහර දර්ශනය වනයට පෙම් බැඳි මුනිවරයන්ගේ සිත් පිනවන්නකි. කාමභෝගී සැපයට ඇලුම් කරන ඒ වෙනුවෙන් ජීවිතය සකස් කරගෙන සිටින ගිහියන්ට පරිසරයේ අසිරිය විඳ ගැනීමේ සීමාවන් පවතී.

"රමණීයානි අරඤ්ඤානි- යත්ථ න රමතී ජනො
වීතරාගා රමිස්සන්ති - න තෙ කාමගවෙසිනො"

(ධම්මපදය, 2020, 46 පිටුව).

අතුපතර මල් පිපී බර වූ ගස්වලින් යුතු, නිල් වන් නිර්මල ජලය සිහින් හඬ දෙමින් ගලා බසිත්. ඇළදොළ ඇති, සියොතුන්ගේ

ස්වරයෙන් කන් පිනවන, ආරණ්‍යය ඉතා රමණීය වේ. මිනිසුන් ද මෙම රමණීය වූ ආරණ්‍යය වෙත පිවිසෙන්නේ විවිධ අපේක්ෂාවන් පෙරදැරිවය. ඖෂධ සොයා හෝ දර සොයා හෝ අල පළා සොයා හෝ කිසියම් හෝ කර්තව්‍යයක් සඳහාය. කාමභෝගී ජනතාවට වනයේ අසිරිය විඳ ගැනීමට වඩා වනය තුළින් ඉටු කරගැනීමට ඇවැසි කාරණාවන් ඇත. ඔවුන්ගේ සිත් වනයේ රමණීයත්වය නොදකී. හඳුනාගැනීමට අපොහොසත් වෙත්. ඔවුන් වනයේ පිපී ගිය නෙක නෙක මල් වල නොඇලෙන ගම්මැස්සන් වැනි ය. තව දුරටත් කාමයන් පසු පස හඹා නොයන්නා වූ දුරු කළ රාග ඇති උතුමන් වහන්සේලා වනයේ ඇති සුන්දරත්වය රමණීයත්වය කෙරෙහි ඇලෙත්. කෙසේ ද යත් නොයෙක් පුෂ්පයන්ගෙන් අලංකාර වූ වනයේ හැසිරෙන බමර මීමැස්සන් එහි ඇලෙන්නාක් මෙනි.

> "විගතරාගා පන ඛීණාසවා නාම භමරමධුකරා විය
> පදුමවනෙසු තථාරූපෙසු අරඤ්ඤෙසු රමිස්සන්ති"
> (ධම්මපදට්ඨකථා, 2020, 46 පිටුව).

සාරිපුත්තත්ථෙර අපදාන වර්ණණාවෙහි උන්වහන්සේ අතීත භවයක තමන් වහන්සේ වාසය කළ ස්ථානය පිළිබඳ මනහර වර්ණනාවක් සිදු කරයි. හිමවතට ඉතාමත් සමීපයේ පිහිටි එම ආරාමය ස්වභාව සුන්දරත්වයෙන් පිරිපුන් ව පැවති ආකාරය ඉතාමත් චමත්කාරයෙන් යුක්ත ව වර්ණනා කර ඇත. වර්තමානයේ පරිසරය කෙරෙහි අනිසි ආකාරයෙන් මිනිසාගේ ක්‍රියාකාරිත්වය බලපෑවද, එවැනි තත්ත්වයක් අතීතයේ එක් යුගයක හෝ පැවති බවක් ගම්‍ය නොවේ. වීතරාගි උත්තමයන් වහන්සේලා පරිසරය සම්බන්ධයෙන් කර ඇති වර්ණනා ත්‍රිපිටකය තුළ සහ අට්ඨකථාවන් තුළ සුලභව දැකිය හැකිය.

> "උත්තානකූලා නදිකා - සුපතිත්ථා මනොරමා
> සුසුද්ධපුලිනාකිණ්ණා - අවිදූරෙ මමස්සමං"
> (සාරිපුත්තත්ථෙරඅපදානවණ්ණනා)

සංසාරික විමුක්තිය සොයන විමුක්තිකාමීන් සිය වාසස්ථානය වශයෙන් නිරන්තරයෙන් තෝරා ගෙන ඇත්තේ

සුන්දර වටපිටාවකින් හෙබි හුදකලා පරිසරයයි. එහි ඇත්තේ පරිසරයේ ඇති අශූන්‍යත්වය විනා නගරයේ හෝ ගමෙහි ඇති අනේකාකාර සංඥවන් නොවේ. ග්‍රාම සංඥවෙන් ශූන්‍ය වූ රමණීය ආරණ්‍යය කම් සැප බැහැර කළ උත්තමයන්ගේ නිවහන විය. සාරිපුත්ත ථෙර අපදානයෙහි ආරාමය පිහිටි ආකාරය සිත් බඳනා ආකාරයෙන් විස්තර කර ඇත. "නො ගැඹුරු ඉවුරු වලින් සමන්විත මනාව පිහිටි කුඩා තොටුපළයන්ගෙන් යුක්ත, සුදෝ සුදු වැලිතලාවන්ගෙන් ගැවසීගත් කුඩා ගඟක් ආසන්නයෙහි මාගේ අසපුව ඇත" සමෘද්ධිමත් මහා නගරයන්හි පිහිටි මහල් ප්‍රසාදයෝ අලුයම ලූ කෙළ පිඩක් සේ හැර දා පැමිණි විමුක්තිකාමීන් විඳගන්නේ නම් විඳගන්නේ පරිසරයේ ඇති සුන්දරවය පමණක් ම බව නොවේද මෙම අපූරු වර්ණනාවන්ගෙන් සනාථ වන්නේ.

"අසක්ඛරා අපබ්භාරා සාදු අප්පටිගන්ධිකා
සන්දති නදිකා තත්ථ සොභයන්තා මමස්සමං"
(සාරිපුත්තත්ථෙරඅපදානවණ්ණනා)

ස්වභාවික පරිසරය විශ්මයජනකය. තේජාන්විත කඳු අතරින් ගලා බස්නා ජල දහරාවන්ගෙන් සමන්විත සුන්දර පරිසර පද්ධතිය ආශ්වාදජනකය. නේකාකාර අංගයන්ගෙන් සුසැදි පිරිපුන් පරිසර පද්ධතියක් පිළිබඳ සැරියුත් ථෙර අපදානයෙහි විස්තර ඉදිරිපත් වේ. කිසිඳු දුර්ගන්ධයක් නොමැති පිරිසිදු ජලය ඇති නදිය ද, එහි වසන්නා වූ කිඹුල්, ඉදිබු ආදි සත්ත්වයන් ද විවිධ මත්ස්‍ය වර්ගයන් ද, ගං ඉවුරේ ඇති මලින් හා ඵලින් බර වූ මහා වෘක්ෂයන් ද, දිව්‍ය සුවඳ වහනය කරන්නා වූ සල්, මී අඹ, ඇසළ, පළොල්, වැටකේ, අශෝක, දොඹ, නා ආදී මල් පිපිණු ශාකයන් ද, සුදු නෙළුම්, රතු නෙළුම් හා උපුල් මලින් සමන්විත වූ මැනවින් නිමවන ලද තටාකයන් ද බක් මී, නෙල්ලි, ජම්බු, ඩෙබර, බෙලි, සලල ආදී මිහිරි ඵලයන්ගෙන් සමන්විත වෘක්ෂයන් ද පරෙවියෝ, හංසයෝ සක්වාලිහිණියෝ, කොකිලයෝ, ගිරාමලිත්තෝ, ආදීන් මෙන් ම සිංහ, ව්‍යාඝ්‍ර, දිවි, වලස්සු ආදී විවිධාකාර සත්ත්වයන්ගෙ න් ද සමන්විත අපූරු පරිසරයක් පිළිබඳ දීර්ඝ විස්තරයක් ඇතුලත් ව ඇත.

භාග්‍යවතුන් වහන්සේ ආයුස්සංස්කාරය හැර දැමීමට මොහොතකට පෙර ආනන්ද හිමියන්හට තෙවරක් ප්‍රකාශ කරන්නේ,

"රමණීයානි ආනන්‍ද වෙසාලී, රමණීයං උදෙනං චෙතියං, රමණීයං ගොතමකං චෙතියං, රමණීයං සත්තම්බං චෙතියං, රමණීයං බහුපුත්තං චෙතියං, රමණීයං සාරන්‍දදං චෙතියං, රමණීයං චාපාලං චෙතියං" (දීඝ නිකාය II, 2020, 184 පිටුව).

භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේ වැඩ වාසය කළ ස්ථානයන් පිළිබඳ වර්ණනා කරන්නේ "ආනන්දය රජගහනුවර සිත්කලු ය, චෝරප්‍රපාතය සිත්කලු ය, සප්තපර්ණිගුහාව සිත්කලු ය, කාලශිලාව සිත්කලු ය, සප්පසොණ්ඩිකපබ්භාරය සිත්කලු ය, තපෝදාරාමය සිත්කලු ය, මද්දකුච්ඡි වනය සිත්කලු ය ආදී වශයෙනි. තව ද විසල් නුවර ද උදේන චෛතිය ද, ගොතමක චෛතිය ද, සත්තම්බචෛතිය ද, බහුපුත්තචෛතිය ද, සාරන්‍දදචෛතිය ද චාපාලචෛතිය ද රමණීය බව භාග්‍යවතුන් වහන්සේ දේශනා කරන්නේ නැවත ඒ ස්ථානයන් කරා වැඩම නොකරන හෙයිනි. උන්වහන්සේ විශාලා මහනුවරින් පිටත් වන්නට පෙර ආනන්ද හිමියන් අමතා දේශනා කරන්නේ, "ආනන්දයෙනි, මේ තථාගතයන්ගේ අවසන් වේසාලි නුවර දර්ශනය බවය" (දීඝ නිකාය II, 2020, 186 පිටුව).

"ඉදං පච්ඡිමකං ආනන්ද, තථාගතස්ස වෙසාලියා දස්සනං භවිස්සති"

සිද්ධාර්ථ කුමාර උප්පත්තිය, දුෂ්කර ක්‍රියා, බුදු වීම, මංගල ධර්ම දේශනය, පිරිනිවන ආදී බුද්ධ චරිතයේ සුවිශේෂී අවස්ථාවන් සිදුවන්නේ පරිසරය ඇසුරේ ය. භාග්‍යවතුන් වහන්සේට පිරිනමන ප්‍රථම ආරාම පූජාව ද උණ ගස් වලින් යුත්ත වනයකි. ත්‍රිපිටකය තුළ මෙන්ම අටුවා තුළත් පරිසරයේ සුන්දරත්ය අගය කරන එහි රමණීයත්වය වර්ණනා කරන දේශනා සුලභය. මෙම සූත්‍ර දේශනා අධ්‍යයනයේදී පෙනී යන්නේ අතීතයේ ජනතාව පරිසරය හා අන්‍යෝන්‍ය වශයෙන් ඒකාත්මිකව කටයුතු කර ඇති බවකි.

බුදුරජාණන් වහන්සේ ස්වභාව සෞන්දර්යයේ වැදගත්කම ඉතා හොඳින් වටහා ගෙන නිවන් මාර්ගයෙහි හික්මෙන සිය ශ්‍රාවකයන්ට එහි ඇති ප්‍රයෝජන පෙන්වා දී ඇත. බුදු දහම තුළින් පරිසරයට කිසියම් හෝ හානියක් වන ක්‍රියාවක් අනුමත වන්නේ නැත.

**පරිසර සංරක්ෂණය පිළිබඳ, නූතන උපාය මාර්ග හා බෞද්ධ පිළිවෙත**

ලෝක ඉතිහාසයේ වෙන කවරදාවත් නො දුටු නො විරූ ආකාරයෙන් පරිසර දූෂණය වර්තමානයේ උග්‍ර වී ඇත. නූතන මිනිසා නොයෙකුත් සංවර්ධන උපාය මාර්ගයන් ඔස්සේ සිය අභිලාෂයන් මුදුන් පමුණුවා ගනිද්දී, එහි අනිටු විපාකයන්ට මුහුණ පාන්නේ පරිසරයයි. මිනිසා සහ පරිසරය අතර පැවතිය යුතු අවියෝජනීය බැඳීම අන්‍යෝන්‍ය සබඳතාව ඊනියා සංවර්ධන ක්‍රියාවලිය හේතුවෙන් දෙදරා ගොස් ඇත. දිනෙන් දින ඉතා සංකීර්ණ සහ බහුවිධභාවයෙන් යුක්ත පාරිසරික ගැටලු නිර්මාණය වෙමින් පවතී. වර්තමානයේ බහුලව දැකිය හැකි පරිසර ගැටලු කිහිපයක් පහතින් දක්වේ.

- දේශගුණික විපර්යාස,
- වන විනාශය,
- ජල දූෂණය හා ජල හිඟය,
- වායු දූෂණය,
- ජෛව විවිධත්වය අහිමි වීම,
- ප්ලාස්ටික් දූෂණය,
- අවිධිමත් ධීවර ක්‍රම,
- ඉඩම් අවිධිමත් ආකාරයෙන් සංවර්ධනය කිරීම,
- ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය,

- න්‍යෂ්ටික අපද්‍රව්‍ය,
- සාගර ආම්ලිකකරණය...

ලෝකයේ බොහෝ රටවල් අඩු වැඩි වශයෙන් ඉහත සඳහන් කළ පාරිසරික දූෂණයන්ට දායක වේ. මෙම පරිසර ගැටලු විසඳීම සඳහා අන්තර් ජාතික වශයෙන් මැදිහත් වීම්, ප්‍රතිපත්ති, එකඟතා, සහයෝගීතාවයන් ඉදිරිපත් වුව ද පරිසරය හානිය දිනෙන් දින උග්‍ර වෙමින් පවති. පරිසරය පිළිබඳ අමතක කර මිනිසුන් සිය ඉලක්කයන් කරා හඹා යද්දී, පරිසරය දිනෙන් දින අප හා උරණ වීම නො වැළැක්විය හැකිය. අතීතය හා තුලනය කිරීමේදී වර්තමානයේ තාක්ෂණය, කාර්මිකරණය, ආර්ථික ප්‍රසාරනය හා ජනඝනත්වයත් පරිසරයට මහත් බලපෑමක් ඇති කර ඇත (Adult and Non Formal Education, 2010, 146). මේ අතර පරිසරයට සංවේදී මිනිසුන් පරිසරය සම්බන්ධයෙන් ආචාර ධර්ම ඉදිරිපත් කරමින් පරිසර දූෂණය අවම කර ගැනිමෙහිලා වඩ වඩාත් උත්සුක වී ඇත.

පරිසර විනාසය හේතුවෙන් මනුෂ්‍ය ප්‍රජාවට මුහුණ පාන්නට සිදු වන දිගුකාලීන අභියෝග අතරින් ප්‍රධාන වන්නේ දේශගුණික විපර්යාසයන් ය. පෘථිවි උෂ්ණත්වය, වර්ෂාපතනය, වායුගෝලීය තත්වයන් මේ අතරින් සුවිශේෂී වේ. තෙල්, ගල් අඟුරු, ස්වාභාවික වායු ආදී පොසිල ඉන්ධන භාවිතයෙන් පරිසරයට නිකුත් කරන කාබන් ඩයොක්සයිඩ් දිනෙන් දින අධික වෙමින් පවතිඃ look at development, 2023, 651 පිටුව). පරිසරය උෂ්ණත්වය වැඩි වීම හේතුවෙන් අයිස් කඳු හා ග්ලැසියර දිය වී මුහුදු ජල මට්ටම ඉහල යාම සිදු වේ. මෙම තත්වය මාලදිවයින වැනි දූපත් රට වලට අහිතකර ලෙස බලපායි. එමෙන්ම ගංවතුර, කුණාටු, නියඟ කාලගුණික රටාවන් වෙනස් වීම හේතුවෙන් අතීතයට සාපේක්ෂව බෙහෙවින් මනුෂ්‍ය ප්‍රජාව පෙළීමට පත් කර ඇත. ඇතැම් පාරිසරික ගැටලු සැබැවින්ම ගෝලීය ස්වභාවයක් ගන්නා බැවින් ඒවා විසඳීමට ජාත්‍යන්තර සහයෝගීතාවය අවශ්‍ය වේ.

ජනගහනය අධික වීමට සමඟ මිනිසාගේ අනේකාකාර අවශ්‍යතා හේතුවෙන් වනාන්තර විනාස කිරීම සාමාන්‍ය තත්වයට පත්ව ඇත. ජෛව විවිධත්වය අහිමි වී පරිසරය තුළින් දිස් වූ චමත්කාරය දිනෙන් දින මිනිසාගෙන් ඈතට යමින් පවතී. වනාන්තර විනාස කරමින් ජෛව විවිධත්වයට හානිදායක ආර්ථික වශයෙන් ඉතා ලාභදායක වගාවන් කෙරෙහි යොමු වීම පරිසර පද්ධති මෙන්ම මිනිසාට ද දීර්ඝකාලීනව අඳුරු විපාකයන් ගෙන දෙන ක්‍රියාවන් ය. වනාන්තර විනාස කිරීම හා පරිසර පද්ධතියට අහිත කර භෝග වගා කිරීම තුළින් ජල මූලාශ්‍රයන් සිඳීගොස් ඇත. සීමිත වශයෙන් පවතින ජල සම්පත දිනෙන් දින දූෂණය වීම ද අභාග්‍යසම්පන්නය. කර්මාන්ත ශාලා වලින් නිකුත් කරනු ලබන අපද්‍රව්‍ය සෘජුවම මුදා හරින්නේ ජලාශයන් වෙත ය. සංවර්ධනයේ නාමයෙන් වන නොයෙකුත් අකටයුතු ක්‍රියාවන් හේතුයෙන් ජල සම්පත වස විෂයෙන් සමන්විත වී ඇත. කාර්මාන්ත, වාහන හා පොසිල ඉන්ධන දහනයෙන් නිකුත් වන පරිසරයට හානිදායක දුමාරය හේතුවෙන් වායු ගෝලය දූෂණය මෙන්ම අම්ල වැසි ඇති වීම ද මිනිසාගේ පැවැත්මට බල පා ඇත. අප අසල් වැසි ඉන්දියාවේ වායු දූෂණයේ ප්‍රතිවිපාකයන්හි ප්‍රතිඵල ඔවුන්ට පමණක් නොව අසල් වැසි රාජ්‍යයන්ටද බල පා ඇත.

පරිසර විනාසය සම්බන්ධයෙන් බොහෝ සාධක වර්තමානයෙන් ගෙන දැක්විය හැකි වුවද මෙහි අභිලාෂය වන්නේ පරිසරය සම්බන්ධයෙන් බෞද්ධ ආකල්පය කෙරෙහි අවධානය යොමු කිරීමය. බුදු දහම තුළින් මිනිසා යොමු කරන්නේ පරිසරයේ සුන්දරත්වය විඳ දරා ගැනීමට ය. පරිසරයේ සුන්දරත්වය විඳින්නා කිසි විටක පරිසරයට හානියක් පමුණුවන්නේ නැත. පරිසරය මිනිසාට බෙහෙවින් මිත්‍රශීලීය. ප්‍රයෝජනවත්ය. උපකාරකය. තමාට උපකාර කරන්නා හට පෙරළා උපකාර කිරීම සත්පුරුෂයන්ගේ ස්වභාවයක් ය.

"යස්ස රුක්ඛස්ස ඡායාය නිසීදෙය්‍ය සයෙය්‍ය වා
න තස්ස සාඛං භඤ්ජෙය්‍ය මිත්තදුබ්භො හි පාපකො."

(අඞ්කුර පේතවත්‍ථු)

යම් කිසිවකු ගස් සෙවණක හිඳ විඩා සංසිදුවා ගන්නේ නම් හෝ නිදන්නේ නම් හෝ හෙතෙම ඒ ගසේ අත්තක්වත් නොකන්නේය. කොළයක් හෝ නොකඩන්නේය. විනාස නොකරන්නේය. යමෙක් එසේ කරන්නේ නම් ඔහු ලාමක මනුෂ්‍යයෙකි. අසත් පුරුෂයෙකි. උක්ත ගාථා පාඨය ජාතක කථා කිහිපයක ද දැකිය හැකිය. එම උදාහරණය තත්කාලීන භාරතීය ජනවහර තුළින් ගෙන දක්වන්නේ මිත්‍රද්‍රෝහී අසත්පුරුෂයා හඳුනා ගනු වස්ය. ගස් වැල් මිනිසාට අසීමිත ව ප්‍රයෝජන සපයයි. ගස් වැල් ආරක්ෂා කිරීමට විශේෂ අවධානයක් යොමු කළ ශාස්තෘවරයෙක් වශයෙන් බුදුරජාණන් වහන්සේ හැඳින්විය හැකිය. ඵල සහිත ගහක් කිව ගැණිය නොහැකි තරම් සත්ත්ව ප්‍රජාවකට ආහාර සපයයි. එමෙන්ම නාවාතැන් දෙයි. ආරක්ෂා කරයි. එක්තරා අවස්ථාක දේවතාවෙක් පැමිණ භාග්‍යවතුන් වහන්සේගෙන් විමසන්නේ, කවර නම් පුද්ගලයෙක් ට දිවා රෑ පින් වැඩේ ද? දහමෙහි පිහිටි ශීලසම්පන්න වූ කිනම් ජනයෝ දෙව් ලොව යත් දැයි ය. එවිට භාග්‍යවතුන් වහන්සේ පිළිතුරු දෙන්නේ,

"ආරාමරොපා වනරොපා යෙ ජනා සෙතුකාරකා
පපඤ්ච උදපානඤ්ච යෙ දදන්ති උපස්සයං."
(සංයුත්තනිකාය I, 2020, 60 පිටුව.) යනුවෙනි.

ශීල සම්පන්න පුද්ගලයා නිරතුරු පරෝපකාරය කැමතිය. ලෝක යහපතෙහි සිය කාර්යයන් යොදවයි. මල් උයන්, පලතුරු උයන් කරවීම, රුක් රෝපණය ආදී වූ කාර්යයන් පරිසරයේ තිර පැවැත්මට මෙන්ම සියලු දෙනාටම ප්‍රයෝජනවත් කාර්යයන් ය. මෙම කාර්යන්හි නිරත වන්නා වූ ශීලවන්ත පුද්ගලයන් මරණින් මතු සුගතිගාමී වේ, යන බුද්ධ දේශනාවෙන් ගම්‍ය වන්නේ පරිසරය ආරක්ෂා කිරීම මෙලොව පමණක් නොව පරලොවට ද හිත පිණිස පවතින බවය. එමෙන්ම පරිසරයට හානි කරන්නා, අවැඩ කරන්නා දුෂ්ශීල අපායගාමී පුද්ගලයෙකු වශයෙන් හඳුනා ගැනීමේ දෝෂයක් නැත. ස්වයංජාත වනාන්තර ආරක්ෂා කිරීම මෙන්ම වන රෝපණය ද බෞද්ධයන් අනාදිමත් කාලයක සිට, සිය අනාගත පරපුර වෙනුවෙන් කළ උතුම් කාර්යයකි.

අතීත වැසියන් ගස්වැල් තුළ ද ජීවය ඇතැයි සිතූහ. එමෙන්ම ගස්වල රුක් දෙවියන් අරක්ගෙන සිටින බවට අද දක්වා මිනිසුන් විස්වාස කරති. වරක් අළවු වැසි භික්ෂූන් කිසියම් කාරණයක් හේතුවෙන් ගස් කැපීම ද කැප්පවීම ද කරවීය. එක්තරා භික්ෂුවක් රුක් දෙවියෙක් අරක් ගෙන සිටි ගසක් සිඳින්නට විය. රුක් දෙවියා භික්ෂුවට පවසන ලද්දේ, "තමන්හට නිවසක් හදනු කැමතිව, මාගේ නිවස විනාස නොකරන්නැයි" යනුවෙනි (පාචිත්තියපාළි, 2020, 207 පිටුව). එහෙත් භික්ෂුව ඇයගේ බසට අවනත නොවී රුක කපා දැමීය. අනතුරුව දෙව්දුව තමන්හට සිදු වූ අකටයුත්ත පිළිබඳ භාග්‍යවතුන් වහන්සේ ට පැමිණිලි කළ පසු, අළවි වැසි භික්ෂූන් කැඳවා අවවාද කොට භූතගාම ශික්ෂාපදය උදෙසා ඇත. "භූතගාම පාතබ්‍යාතාය පාචිත්තිය'න්ති" (එම). එනම් යම් කිසි ස්ථානයක බීජ මගින් හටගත් ගස්වැල් විනාස කිරීම පාචිත්තිය ඇවැතක් වන බවයි. කුමනාකාරයෙන් හෝ ගස් වැල් විනාස කිරීම හා අනෙකෙකු ලවා විනාස කරවීම මෙමගින් භික්ෂුවට තහනම් කර ඇත.

ගස්වැල් ආරක්ෂා වීම තුළින් සමස්ථ පරිසර පද්ධතියම ආරක්ෂා වේ. බුදුරජාණන් වහන්සේ තරම් පරිසරයේ ආරක්ෂාව වෙනුවෙන් ක්‍රියා කළ වෙනත් කිසිවකු නොමැති බවට මෙම භූතගාම ශික්ෂාපදය පමණක් වුව ප්‍රමාණවත්ය. මෙහි දි ශාකයක් හට ගන්නා ආකාර පහක් බුදුරජාණන් වහන්සේ පෙන්වා දී ඇත.

1. මූලබීජ
2. ඛන්ධබීජ
3. ඵළුබීජ
4. අග්ගබීජ
5. බීජබීජ

යනුවෙනි. මේ අනුව මුලින් පැලවෙන බීජ, කඳින් පැලවෙන බීජ, පුරුක් වලින් පැල වෙන බීජ, දල්ලෙන් පැලවෙන

බීජ හා ඇට වලින් පැලවෙන බීජ යනුවෙන් ශාකයක් හටගන්නා ආකාර පහක් දක්වා ඇත. මේ ආකාරයන්ගෙන් හටගන්නා ශාක විනාස කිරීම පමණක් නොව නිකරුණේ ගසක කොලයක් හෝ කඩා දැමීම උපසම්පදා භික්ෂුවට අකැප ය. එහෙත් තමන්හට බාධාවක් වන අවස්ථාවලදී පමණක් උපක්‍රමයෙන් තණ හා ගස් වැල් ඉවත් කර දැමීමට අවසර ලබා දී ඇත. මෙම ශික්ෂාපදය ආරක්ෂා කිරීම ශීලයක් වශයෙන් දීඝනිකායේ දක්වා ඇත. "ඉති එවරූපා බීජගාම භූතගාමසමාරම්භා පටිවිරතො හොති... ඉදම්පිස්ස හොති සීලස්මිං"(දීඝනිකාය, 2020, 112 පිටුව). පරිසරය ආරක්ෂා වන පරිදි භික්ෂුවක් කටයුතු කිරිම ශීලයක් වශයෙන් දැක්වීම තුළින් පමණක් ම පරිසරය කෙරෙහි බෞද්ධාකල්පය මනාව පිළිබිඹු වේ.

භූතගාම සික්ඛාපදය අට්ඨකථාව තුළින් තව දුරටත් විවරණය කර ඇත. ඒ අනුව භූත යන්නෙන් වැඩෙත්, හටගණිත්, හටගන්නාහු, වැඩුනාහු යන අර්ථ දනවයි. ගාමො යනු සමූහය යන අර්ථයයි. ඒ අනුව නිල්පැහැති තෘණ වෘක්ෂලතාදීන්ගේ සමූහය භූතගාම යනුවෙන් අටුවාව තුළ දක්වා ඇත. පොළොවෙහි හටගන්නා ශාකයන් මෙන්ම ජලයෙහි ජලජ පැලෑටීන් ද විනාස කිරීම භික්ෂූන්ට අකැපය. ස්නානය කරන විටකදී දියෙන් නොමුදා අතින් එහා මෙහා කරමින් දිය පාදා ගනිමින් ස්නානය කළ යුතු වන අතර දිය සෙවෙල ආදිය එම ස්ථානයෙන් ඉවත් කිරීම ඇවත්ය. එපමණක් නොව නිල් තණකොල මත හා ජලයෙහි මළ මුත්‍ර බැහැර කිරිම කෙළ ගැසීම ආදිය භික්ෂූන් වහන්සේලා විසින් නොකළ යුතු යැයි දේශනා කර ඇත(පාචිත්තියපාලි, 2020, 154 පිටුව). කූටදන්ත සූත්‍රයේදී පෙන්වා දෙන්නේ නිෂ්ඵල කාර්යයන් සඳහා වනය විනාස කිරීම යෝග්‍ය නොවන බවය. "න රුක්ඛා ඡිජ්ජිංසු යූපත්ථාය න දබ්බා ලුයිංසු බරිහිසත්‍ථාය"(දීඝනිකාය I, 2020, 277 පිටුව). මේ තුළින් බ්‍රාහ්මණයන් යාග කිරීමේදී සිදුවන පරිසර හානිය පෙන්වා දි ඇත. පරිසරය තුළ වාසය කරන සත්වයන් මෙන්ම ගස් වැල් ද තෘණ වර්ගයන් ද විනාස කිරීමට බුදුසමයෙන් කිසියම් හෝ අනුබලයක් ලැබෙන්නේ නැත.

පරිසර හිතකාමීත්වය අගය කරන බුදුදහම පරිසරයේ ඇති සම්පත් නිසි පරිදි කළමනාකරණය කරමින් භාවිතා කළ යුතු ආකාරය මැනවින් පෙන්වා දී ඇත. බ්‍රහ්මායු සූත්‍රයේ දි පෙන්වා දෙන්නේ ජල අවශ්‍යතාවයේ ප්‍රමාණය දැන පිළිගත යුතු අකාරයයි(මජ්ඣිමනිකාය II, 2020, 585 පිටුව). ජල පරිහරනය සම්බන්ධයෙන් චුල්ලවග්ගපාළියේ භික්ෂූන්ට උපදෙස් ලබා දී තිබේ. පරිභෝජනීය සම්පත් තිබූ පමණින් අනවශ්‍ය ආකාරයෙන් පරිභෝජනය කිරීම බුදුසමය තුළින් ප්‍රතික්ෂේප වේ. අවශ්‍යතා අනුව සම්පත් කළමනාකරණය කර ගැනීම අත්‍යවශ්‍ය ය. පානීය ජලය හා පරිභෝජනීය ජලය යනුවෙන් ජල සම්පත වර්ග කර නොයෙක් අවශ්‍යතාවයන්ට යොදා ගෙන ඇත. පානීය හා පාරිභෝජනීය වශයෙන් ජලය අත්‍යවශ්‍ය ය. වර්තමානයේ විවිධාකාර ක්‍රම මගින් ජලය දූෂණයට පත් වේ. බොහෝ අපද්‍රව්‍යයන් බැහැර කරන්නේ ජල මාර්ගයන්ට ය. කර්මාන්ත හා ජනාවාස අධික නගර වල ජලමාර්ගයක් අසලින්වත් යා නොහැකි තරමට මිනිසා විසින් ජලය දූෂණය කර ඇත. ජලය දූෂණය වීම මිනිස් සෞඛ්‍යයට පමණක් නොව සමස්ථ පරිසර පද්ධතියටම බලපාන්නේ ය.

පරිසරය සම්බන්ධයෙන් බෞද්ධාකල්පය විවිධ පැතිකඩ ඔස්සේ විද්‍යමාන වේ. වරක් ධනිය නම් භික්ෂුවක් මැටියෙන් ආරාමයක් ඉදිකර පිළිස්සීමට ලක් කර රත් පැහැයෙන් අගනා ලෙස නිමවා තිබෙනු දැක තථාගතයන් වහන්සේ භික්ෂූන් ලවා එම ආරාමය බිඳවන ලද්දේ පසේ ජීවත් වන ප්‍රාණීන් කෙරෙහි දයාවක්, අනුකම්පාවක්, අවිහිංසාවක් එම භික්ෂුවගේ සිතෙහි ඇති නො වුයේ දැයි විමසමිනි. එමෙන්ම එවැනි මැටි කුටි සෑදීම භික්ෂූන්ට ඇවතක් බැව් දේශනා කර ඇත(පාරාජිකාපාළි, 2020, 97 පිටුව). බුදුසමය තුළින් අවට පරිසරයේ වාසය කරන සියලු ජීවින්ගේ ජීවිත ආරක්ෂාව මෙන්ම පසෙහි වෙසෙන ජීවින්ගේ ආරක්ෂාව කෙරෙහි ද අවධානය යොමු කර ඇත. බෞද්ධ ආචාර ධර්මයන් තුළ අවිහිංසාව කේන්ද්‍රීය වේ. බෞද්ධ ප්‍රජාව තමා මෙන් ම පරිසරයේ ජීවත් වන සියලු සත්ත්වයන්ගේ සුඛ විහරණය අපේක්ෂා කරයි.

## නිගමනය

අතීත වැසියන් ඉතා ක්‍රමවත් ආකාරයෙන් පාරිසරික සම්පත් නඩත්තු කරමින් ඉන් ප්‍රයෝජන ගත් ආකාරය මනාව අධ්‍යයනය කිරීම, වර්තමානයේ ඇති වී ඇති බොහෝ පාරිසරික ගැටලු ඵලදායි ආකාරයෙන් විසඳා ගැනීමට උපයුක්ත කර ගත හැකිය. වර්තමාන ලෝක ප්‍රජාව පාරිසරික සම්පත් තිරසාර ආකාරයෙන් පාවිච්චි නොකළහොත්, එමගින් අනාගත පරපුරට බොහෝ අභියෝගයන්ට මුහුණ පාන්නට සිදු වේ. බෞද්ධ ප්‍රතිපත්ති මිනිසුන් සිය දෛනික ජීවිතයට හුරු කර ගැනීම, වර්තමානයේ මෙන්ම අනාගත පරපුරේ යහපැවැත්ම සඳහා ඉවහල් වේ. දිවුල් කනු කැමැතිව පැසුණු ගෙඩි ඇති දිවුල්ගස සොලවා බොහෝ ගෙඩි ගස මුල වැටුණු පසු කෑ යුතු ගෙඩි පමණක් කා ඉතිරිය අතහැර දමා යන්නාක් මෙන්, සම්පත් පරිභෝජනය විනාසයට හේතුවක් බව ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දක්වා ඇත. මෙම ප්‍රකාශයේ වර්තමාන වලංගුතාවය අතිමහත් ය. අද වන විට ලෝකයේ සම්පත් අනිසි ආකාරයෙන් ප්‍රයෝජනයට ගැනීම සුලභ වී ඇත. නැවත ජනනය නොවන සම්පත් තිරසාර ආකාරයෙන් පරිභෝජනය කිරීම අත්‍යවශ්‍ය කාරණයක් මෙන්ම අනාගත පරපුර වෙනුවෙන් ඉටු කරන්නා වූ යුතුකමකි.

අතීත පාලකයන් පරිසරයේ පිහිටීම මනාව වටහාගෙන පරිසරයට හානියක් නොවන පරිදි නගර, කෘෂිකාර්මික ස්ථාන, වැව් අමුණු විහාරාරාම ආදිය ක්‍රමවත්ව ඉඳි කර ඇති ආකාරය අද ද නිරීක්ෂණය කළ හැකිය. කෙසේ නමුත් අදවන විට වගා බිම්, වන බිම්, තෙත් බිම්, කර්මාන්ත ආදිය ඉඳි කළ යුතු ස්ථාන පිළිබඳ නිසි දැනුමක් හෝ මග පෙන්වීමක් නොමැති වීම බොහෝ පාරිසරික ගැටලු වලට හේතු වී ඇත. ආර්ථික වශයෙන් දැඩි ලාභදායි එහෙත් පාරිසරික වශයෙන් ඉතා අහිතකර භෝග වගාවන්ට රාජ්‍ය මට්ටමෙන් යොමු වීම වැනි අදූරදර්ශී ක්‍රියාවන් ද දීර්ඝකාලීනව පාරිසරික ප්‍රශ්න ඇති වීමට හේතු වේ. මහජන දැනුවත්භාවය, උපදේශනය මෙන්ම පරිසරය ආරක්ෂා කිරීම පිණිස නීති රීති පැනවීම අත්‍යවශ්‍යය. බුදුරජාණන් වහන්සේ පරිසරය

ඉතා සුන්දර ආකාරයෙන් වර්ණනා වරණනා කරමින් පරිසරයට වන හානි අවම කිරීම පිණිස පරිසරය හා සම්බන්ධ විනය නිතී පනවා ඇත. ජලයට අපද්‍රව්‍ය මුදා හැරීම වර්තමානයේ බලවත් පාරිසරික ප්‍රශ්නයක් වුවද බුද්ධ දේශනාව අනුව බෞද්ධයන් හට ජලයට කෙළ ගැසීමටවත් ඉඩක් නොමැත. තිරසාර පරිසර පද්ධතියක් ගොඩ නැඟීම උදෙසා, බෞද්ධ ආකල්ප බෙහෙවින් ඉවහල් කර ගත හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය


*දීඝනිකාය 2*, (2020), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, කැලණියඃ නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය.

*ථෙර-ථෙරීගාථාපාළි*, (2020), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, කැලණියඃ නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය.

*ධම්මපදයපාළි*, (2020), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, කැලණියඃ නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය.

*පාචිත්තියපාළි*, (2020), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, කැලණියඃ නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය.

*පාචිත්තියපාළි*, (2020), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, කැලණියඃ නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය.

*මජ්ඣිම නිකාය 2*, (2020), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, කැලණියඃ නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය.

*මහාවංශය සිංහල*, (2004), නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*වංශත්ථප්පකාසිනී-මහාවංස ටීකාව*, (2001), සි. අනුඃ අකුරටියේ අමරවංස හිමි, හේමචන්ද්‍ර දිසානායක, කොළඹ 10ඃ එස්.ගොඩගේ සහ සහෝදරයෝ.

*සිංහල දීපවංශය* ,(2011), සංස්ඃ චන්ද්‍රදාස කහඳව ආරච්චි, කොළඹ 10ඃ ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

*සුමඞ්ගලවිලාසිනී නම් වූ දීඝනිකායට්ඨකථාව* (සිංහල පරිවර්තනය), (2008), පරිඃ බී.එම්.පී. බාලසූරිය, නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

## ද්විතීයික මූලාශ්‍රය


*අපේ සංස්කෘතික උරුමය ප්‍රථම කාණ්ඩය*, (2016), කොළඹ 07: මධ්‍යම සංස්කෘතික අරමුදල.

කුලතුංග, ටී.ජී., (2020), *පුරාණ අභයගිරි විහාරය*, කොළඹ 07: මධ්‍යම සංස්කෘතික අරමුදල.

*ශ්‍රී ලංකා සංස්කෘතික ත්‍රිකෝණය*, (2004), කොළඹ 07: මධ්‍යම සංස්කෘතික අරමුදල.

Douglascollege.ca/course$psyc- Environmental Science Fair Projects, Revised and Expanded Using the Scientific Method By Thomas R. Rybolt, Robert C. Mebane

Mohanty, J. (2002). Adult and Non-formal Education. Deep and Deep Publications.